# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

# විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර)

# 2024/2025 - අධ්‍යයන වර්ෂය

**පාඨමාලාව පිළිබඳ විස්තර හා ප්‍රවේශ ප්‍රතිපත්තිය**

**හැඳින්වීම : පරමාර්ථ හා අරමුණු**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගිකව පුහුණු කිරීම හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථෙරවාදී බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, තුලනාත්මක සමය අධ්‍යයනය, බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ කිරීමට ධෛර්යය දීම යනාදි පරමාර්ථ ඉටුකර ගැනීමේ අරමුණින් සංස්ථාපනය කරන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

**1. ප්‍රවේශ ප්‍රතිපත්තිය**

1.1 විශ්වවිද්‍යාලයට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලැබිය යුතු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ මුළු සංඛ්‍යාව ඒ ඒ පීඨවලට බෙදා හැරිය යුතු ආකාරය කලින් කලට විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් තීරණය කරනු ලැබේ.

1.2 විශ්වවිද්‍යාල අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තෝරා ගැනීම විශ්වවිද්‍යාල සනාතන සභාවේ නිර්දේශ මත පාලක සභාව විසින් සිදු කරනු ලැබේ.

1.3 අභ්‍යන්තර පැවිදි ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී උපැවිදි වුවහොත් ශිෂ්‍යභාවය හා ඊට හිමි සියලු වරප්‍රසාද අහිමි වේ.

1.4 පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ලබා ඇති ඉසෙඩ් ලකුණ (Z-Score) හා භික්ෂු ආකල්ප පිළිබඳ ඇගයීමට ලක්කොට සනාතන සභාවේ නිර්දේශය මත පාලක සභාව විසින් තීරණය කරනු ලැබේ.

**1.5 සංස්කෘත/පාලි සඳහා විශේෂ ප්‍රවේශය**

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ අරමුණු හා පරමාර්ථ අනුව විශ්වවිද්‍යාලය තුළ සංස්කෘත හා පාලි අධ්‍යයනයට ශිෂ්‍ය හිමිවරුන් උනන්දු කරවීම අරමුණු කොට පුවත්පත් දැන්වීමේ සඳහන් වසරවල පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සංස්කෘත හෝ පාලි විෂයයට සාමර්ථ්‍යයක් සහිතව අදාළ ප්‍රවේශ සුදුසුකම සපුරා ඇති පැවිදි ශිෂ්‍යයන්ගෙන් සීමිත සංඛ්‍යාවක් සංස්කෘත හා පාලි විෂයයන් අනිවාර්ය කොට විශ්වවිද්‍යාලයට බඳවා ගනු ලැබේ.

**1.6 ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන විෂය සඳහා විශේෂ ප්‍රවේශය**

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත යටතේ දක්වා ඇති ආකාරයට බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ භාවනා පිළිබඳ පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම වැනි පරමාර්ථ සාධනය කර ගැනීම පිණිස ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන විෂය අනිවාර්ය කොට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සීමිත සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලයට බඳවා ගනු ලැබේ.

**1.7** බඳවා ගන්නා සිසුන්ට මෙම විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ පසු වෙනත් විශ්වවිද්‍යාලවල හෝ උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි විය නොහැක.

## 2. බඳවා ගන්නා ආකාරය

2.1 2021,2022,2023 සහ 2024 අ.පො.ස. (උසස් පෙළ) විභාගයකදි විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ඉසෙඩ් ලකුණුවල (Z-Score) ප්‍රමුඛතාව මත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර එහිදි ලබාගන්නා ලකුණු පදනම් කරගෙන බඳවා ගනු ලැබේ.

2.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත බඳවාගන්නා සිසුන් සාමාන්‍ය පොදු පරීක්ෂණයේදී 30% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම අනිවාර්ය වේ.

2.3 මේ හැර ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයයෙන් සමත් භික්ෂූන් වහන්සේලා ද තෝරාගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට බඳවා ගනු ලැබේ.

## 3. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්

| | | |
|---|---|---|
| 01. | බෞද්ධ විහාර දේවාලගම් පනතේ නියමයන්ට අනුකූලව ලියාපදිංචි වූ භික්ෂූන් වහන්සේ නමක් වීම | |
| | | **හා** |
| 02. | i) | බුද්ධ ධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය සහ පාලි/ සංස්කෘත/ වෙනත් භාෂා විෂයයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |
| | ii) | ප්‍රාචීන මධ්‍යම විභාගය සමත් වී තිබීම.<br><br>(විශ්වවිද්‍යාලයට තෝරා ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 10%ක් වන අනුපාතයට ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන මධ්‍යම විභාගයෙන් භාෂාත්‍රයෙන් සමත් භික්ෂූන් වහන්සේලා බඳවා ගනු ලැබේ.) |
| | | **හෝ** |
| | iii) | බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයයක්වත් ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම. |
| | | **හෝ** |
| | iv) | ඕනෑම කලා විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයක් යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් (වසරක හෝ ඊට වැඩි) ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම. (SLQF Level 3 / NVQ Level 5 ) |
| | | **හෝ** |
| | v) | ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම.<br><br>ඉහත අංක i, ii, iii හා iv යටතේ සුදුසුකම් සපුරා ඇති ස්වාමීන් වහන්සේලා ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් අංක (v) යටතේ සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |

*ප්‍රවේශ සුදුසුකම් රජය මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හෝ මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් හෝ කලින් කල නියම කරනු ලබන නිර්නායක අනුව වෙනස්වීමට යටත් වනු ඇත.*

**4. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය භිමිනමක් ලෙස ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් <u>නොලබන</u> අයදුම්කරුවන්**

4.1 අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා තුන් වතාවකට වඩා වැඩි වාර ගණනක් පෙනී සිටි අය.

4.2 වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක අභ්‍යන්තර හෝ බාහිර ශිෂ්‍යයෙකු වශයෙන් උපාධි පාඨමාලාවක් සඳහා දැනටමත් ලියාපදිංචි වී ඇති අය.

4.3 දිවයිනේ වෙනත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා ඇති අය.

**5. අභ්‍යන්තර ප්‍රථම උපාධි පාඨමාලා**

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව : වසර 03
2. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - බෞද්ධ දර්ශනය : වසර 04
3. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - බෞද්ධ ශිෂ්ටාචාරය : වසර 04
4. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - පාලි : වසර 04
5. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - පුරාවිද්‍යාව : වසර 04
6. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - සංස්කෘත : වසර 04
7. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය : වසර 04
8. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව : වසර 04

**6. අභ්‍යන්තර ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා විෂයයන් තෝරා ගැනීම**

මෙම විශ්වවිද්‍යාලයට ඇතුළත් වන සෑම ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක්ම ප්‍රථම වර්ෂයේ දී ප්‍රධාන විෂය පාඨමාලාව ලෙස බෞද්ධ දර්ශනය විෂය හැදෑරිය යුතු අතර දෙවන වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) හෝ ශාස්ත්‍රවේදී/බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය සඳහා ප්‍රධාන විෂය පාඨමාලාවක් ලෙස හෝ වෛකල්පික විෂය පාඨමාලාවක් ලෙස (විශේෂ අවසරයක් ලබා ගැනීමකදී හැර) බෞද්ධ දර්ශනය විෂය හැදෑරිය යුතුය. එය මෙම විශ්වවිද්‍යාලයේ අනන්‍යතාවයි.

**6.1 ප්‍රථම වර්ෂය සඳහා විෂයයන් තෝරා ගැනීම**

ප්‍රථම වර්ෂය සඳහා ප්‍රධාන විෂය පාඨමාලා (03) තුනකි.

| | |
|---|---|
| පළමු විෂය | බෞද්ධ දර්ශනය (සියලුම සිසුන්ට අනිවාර්ය කර ඇත) |
| දෙවන විෂය | ශිෂ්‍ය භිමිවරුන්ගේ ඉල්ලීම් හා අධ්‍යයන අංශවල පවතින පුරප්පාඩු සැලකිල්ලට ගෙන අනිවාර්ය කළ විෂයයකි.* |
| තෙවන විෂය | උක්ත විෂයයන් දෙක සැලකිල්ලට ගෙන වඩාත් සුදුසු විෂයයක් තෝරා ගැනීමට උපදෙස් දෙනු ලැබේ.<br>• *තෝරාගත් මෙම විෂය වෙනස් කර ගැනීමට අවශ්‍ය නම් ප්‍රථම සමාසිකය ආරම්භ වී සති (02) දෙකක් ඇතුළත ශිෂ්‍ය සේවා අංශයෙන් ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.* |

** යම් ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් ප්‍රථම වසර ආරම්භයේ දී පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්ව ප්‍රධාන විෂය පාඨමාලාවක් වශයෙන් ඉංග්‍රීසි විෂය තෝරා ගන්නේ නම් හෝ උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට තෝරා ගන්නේ නම්**

***හෝ***

*පාලි, සංස්කෘත යන භාෂා විෂයයක් තෝරා ගැනීමට අවසර ඉල්ලා සිටින්නේ නම් විශ්වවිද්‍යාලය මගින් අනිවාර්ය කර බඳවා ගත් දෙවන විෂය අදාළ අධ්‍යයනාංශාධිපතිගේ නිර්දේශය හා පීඨාධිපතිගේ අනුමැතිය මත වෙනස් කර ගැනීමට අවස්ථාව සලසා ඇත. මේ හැර වෙනත් කිසිදු හේතුවක් මත මෙම විෂය වෙනස් කරනු නොලැබේ.*

***ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත ශිෂ්‍යයන් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණයට පෙනීසිට අවශ්‍ය සාමර්ථ්‍යය ලබාගත යුතුය.**

**ප්‍රථම වසර පාඨමාලා සැකැස්ම**

| | පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|---|
| 1 | බෞද්ධ දර්ශනය | බෞද්ධ දර්ශනය |
| 2 | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව |
| 3 | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව |
| 4 | අනිවාර්ය පදනම් පාඨමාලාව A | අනිවාර්ය පදනම් පාඨමාලාව C |
| 5 | අනිවාර්ය පදනම් පාඨමාලාව B | අනිවාර්ය පදනම් පාඨමාලාව D |
| 6 | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) |
| 7 | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) |

**6.2 දෙවන වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සඳහා විෂයයන් තෝරාගැනීම**

දෙවන වර්ෂයේ සිට ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සඳහා ප්‍රථම වර්ෂයේ දී හැදෑරූ ප්‍රධාන විෂය පාඨමාලා තුන අනිවාර්යයෙන් හැදෑරිය යුතුය. ඊට අතිරේකව එක් සමාසිකයක් සඳහා වෛකල්පික විෂයයන් දෙකක් (02) තෝරා ගත යුතුය. වෛකල්පික විෂයයන් තෝරා ගැනීමේ දී ශිෂ්‍ය අත්පොත හත්වන (සංශෝධිත) මුද්‍රණයේ **3.5.1** උප වගන්තියෙන් දක්වා ඇති උපදෙස් පිළිපැදීමට වගබලා ගත යුතු වේ.

**දෙවන වසර පාඨමාලා සැකැස්ම - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය**

| | පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|---|
| 1 | බෞද්ධ දර්ශනය | බෞද්ධ දර්ශනය |
| 2 | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව |
| 3 | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව |
| 4 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 5 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 6 | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) |
| 7 | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) |
| 8 | | අනිවාර්ය භාවනා පාඨමාලාව (අර්ඝ රහිත) |

**තෙවන වසර පාඨමාලා සැකැස්ම - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය**

| | පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|---|
| 1 | බෞද්ධ දර්ශනය | බෞද්ධ දර්ශනය |
| 2 | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව | අනිවාර්ය කළ ප්‍රධාන විෂය පාඨමාලාව |
| 3 | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව | තෝරාගත් ප්‍රධාන විෂය පාඨමාලාව |
| 4 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 5 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 6 | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) |
| 7 | Foundation Course in Information Teachnology (වෛකල්පික අර්ඝ රහිත) | Foundation Course in Information Teachnology (වෛකල්පික අර්ඝ රහිත) |
| 8 | අනිවාර්ය භාවනා පාඨමාලාව (අර්ඝ රහිත) | |

**6.3 දෙවන වර්ෂයේ සිට ශාස්ත්‍රවේදි (ගෞරව)/ බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධිය සඳහා විෂයයන් තෝරා ගැනීම**

දෙවන වර්ෂයේ සිට ශාස්ත්‍රවේදි (ගෞරව)/ බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධිය සඳහා විෂයයන් තෝරා ගැනීමේ දී පහත සඳහන් උපදෙස් පිළිපැදිය යුතු වේ.

1. **බෞද්ධ දර්ශනය** විෂය ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය සඳහා තෝරා ගන්නේ නම් විශ්වවිද්‍යාලය අනිවාර්ය කර බඳවාගත් විෂය පාඨමාලාවෙන් වෛකල්පික පාඨමාලාව තෝරා ගත යුතුය. එසේ වුවද යම් ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් වෛකල්පික විෂය වශයෙන් ඉංග්‍රීසි/පාලි/සංස්කෘත යන විෂයයන් අතුරින් එක් විෂයක් තෝරා ගැනීමට කැමැත්තක් දක්වන්නේ නම් ඒ බව අදාළ අංශාධිපති හිමියන් මගින් පීඨාධිපති හිමියන් වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතුය. පීඨාධිපති හිමියන්ගෙන් එම ඉල්ලීමට අවසරය ලැබුණහොත් පමණක් තත් විෂය තෝරා ගැනීමට හැකි වේ.
2. වෙනත් **ප්‍රධාන විෂයක්** ශාස්ත්‍රවේදි (ගෞරව) උපාධිය සඳහා තෝරා ගන්නේ නම් බෞද්ධ දර්ශනය වෛකල්පික විෂය වශයෙන් තෝරා ගත යුතුවේ. එසේ වුවද යම් ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් වෛකල්පික පාඨමාලාව වශයෙන් ඉංග්‍රීසි විෂය තෝරා ගැනීමට කැමැත්තක් දක්වන්නේ නම් ඒ බව අදාළ අංශාධිපති හිමියන් මගින් පීඨාධිපති හිමියන් වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතුය. පීඨාධිපති හිමියන්ගෙන් එම ඉල්ලීමට අවසරය ලැබුණහොත් පමණක් ඉංග්‍රීසි විෂය තෝරා ගැනීමට හැකි වේ.
3. බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධිය තෝරා ගත් සිසුන් අනිවාර්යයෙන් බෞද්ධ දර්ශනය විෂය වෛකල්පික පාඨමාලාව වශයෙන් තෝරා ගත යුතුය.

**<u>දෙවන වසර පාඨමාලා සැකැස්ම - ශාස්ත්‍රවේදි /බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධිය</u>**

| | **පළමු සමාසිකය** | **දෙවන සමාසිකය** |
|---|---|---|
| 1 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 2 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 3 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 4 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් වෛකල්පික විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් වෛකල්පික විෂය |
| 5 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 6 | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) |
| 7 | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) | Foundation Course in Information Teachnology (අර්ඝ රහිත) |
| 8 | | අනිවාර්ය භාවනා පාඨමාලාව (අර්ඝ රහිත) |

**<u>තෙවන වසර පාඨමාලා සැකැස්ම - ශාස්ත්‍රවේදි /බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධිය</u>**

| | **පළමු සමාසිකය** | **දෙවන සමාසිකය** |
|---|---|---|
| 1 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 2 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 3 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 4 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් වෛකල්පික විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් වෛකල්පික විෂය |
| 5 | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව | තෝරාගත් වෛකල්පික විෂය පාඨමාලාව |
| 6 | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය ඉංග්‍රීසි පාඨමාලාව (අර්ඝ රහිත) |
| 7 | Foundation Course in Information Teachnology (වෛකල්පික අර්ඝ රහිත) | Foundation Course in Information Teachnology (වෛකල්පික අර්ඝ රහිත) |
| 8 | අනිවාර්ය භාවනා පාඨමාලාව (අර්ඝ රහිත) | අනිවාර්ය භාවනා පාඨමාලාව (අර්ඝ රහිත) |

**සිව්වන වසර පාඨමාලා සැකැස්ම - ශාස්ත්‍රවේදී /බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය**

| | පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|---|
| 1 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 2 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 3 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 4 | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය | ගෞරව උපාධි පාඨමාලාවට අයත් අනිවාර්ය විෂය |
| 5 | ස්වාධීන නිබන්ධය I | ස්වාධීන නිබන්ධය II |

## 7. විෂය පාඨමාලා සහ විෂය සංකේත

### 7.1 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ගෞරව) උපාධි ප්‍රධාන විෂය පාඨමාලා

| | විෂය | විෂය සංකේතය | B.A (General) | Medium | B.A (Special) | Medium |
|---|---|---|---|---|---|---|
| 01 | බෞද්ධ දර්ශනය (Buddhist Philosopy) | BUPH | ✓ | S/E | ✓ | S/E |
| 02 | බෞද්ධ ශිෂ්ටාචාරය (Buddhist Civilization) | BUCZ | ✓ | S/E | ✓ | S |
| 03 | පාලි (Pali) | PALI | ✓ | S/E | ✓ | S |
| 04 | සංස්කෘත (Sanskrit) | SANK | ✓ | S/E | ✓ | S |
| 05 | පුරාවිද්‍යාව (Archaeology) | ARCH | ✓ | S/E | ✓ | S |
| 06 | ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය (Practical Buddhist Studies) | PBUS | ✓ | S | | S |
| 07 | උරුම කළමනාකරණය (Heritage Management) | HEMG | ✓ | S | | S |
| 08 | පුස්තකාල හා විඥාපනවිද්‍යාව (Library and Information Science) | LISC | ✓ | S | | S |
| 09 | මනෝවිද්‍යාව (Psychology) | PSYC | ✓ | S | | S |
| 10 | දර්ශනය (Philosopy) | PHIL | ✓ | S | | S |
| 11 | ඉතිහාසය (History) | HIST | ✓ | S | | S |
| 12 | සමාජවිද්‍යාව (Sociology) | SOCI | ✓ | S | | S |
| 13 | සිංහල (Sinhala) | SINH | ✓ | S | | S |
| 14 | English | ENGL | ✓ | E | | E |
| 15 | අධ්‍යාපනවිද්‍යාව (Education Science) | EDSC | ✓ | S | | S |
| 16 | බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය (Buddhist Psychology and Counselling) | BPCO | ✓ | S | ✓ | S |

***** S - සිංහල මාධ්‍ය / E - ඉංග්‍රීසි මාධ්‍ය

මෙම විශ්වවිද්‍යාලයට 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා බඳවාගත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින් බෞද්ධ දර්ශනය විෂය අනිවාර්යයෙන් හැදෑරිය යුතු අතර තවත් ප්‍රධාන විෂයයන් දෙකක් හැදෑරිය යුතුය.

ඉන් එක් විෂයයක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශවල පවතින විෂය පුරප්පාඩු සහ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේගේ මනාපය සැලකිල්ලට ගෙන පහත 7.1.1 වගුවෙහි සඳහන් එක් විෂය කාණ්ඩයකින් නියමකරනු ලබන අතර එය එම ශිෂ්‍ය ස්වාමීන් වහන්සේගේ අනිවාර්ය විෂය වේ.

අනෙක් විෂය පහත 7.1.1 වගුවේ සඳහන් වෙනත් විෂය කාණ්ඩයකින් තෝරාගත යුතු අතර එය විශ්වවිද්‍යාලය විසින් තෝරා දී ඇති අනිවාර්ය විෂය ඇතුළත් කාණ්ඩයට අයත් නොවිය යුතුය.

### 7.1.1 වගුව

| කාණ්ඩය 1 | කාණ්ඩය 2 | කාණ්ඩය 3 |
|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය | දර්ශනය | පාලි |
| ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය | බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය | සංස්කෘත |
| පුරාවිද්‍යාව | පුස්තකාල හා විඥාපනවිද්‍යාව | ඉංග්‍රීසි |
| සමාජ විද්‍යාව | අධ්‍යාපන විද්‍යාව | |
| මනෝවිද්‍යාව | උරුම කළමනාකරණය | |
| සිංහල | ඉතිහාසය | |

**7.2 බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධි පාඨමාලාව**

ප්‍රථම වසර පරීක්ෂණවලින් දක්ෂතා දක්වන සීමිත ශිෂ්‍ය හිමිවරුන් පිරිසක් දෙවන වර්ෂයේ දි මෙම පාඨමාලාවට ඇතුළත් කර ගනු ලැබේ. අධ්‍යාපනවේදි (ගෞරව) උපාධි පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පමණක් හැදෑරිය හැක.

**7.3 ප්‍රථම වර්ෂය තුළ හැදෑරිය යුතු අනිවාර්ය පදනම් පාඨමාලා**

| | විෂය | විෂය සංකේතය | Semester | | Medium | |
|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | S | E |
| A | ලේඛන කුසලතා (සිංහල මාධ්‍ය සිසුන් සඳහා පමණි) Writing Skills (only for English medium Students) | FNDS/E | ✓ | | ✓ | ✓ |
| B | භාවනා හා බෞද්ධ උපදේශනය (Meditation and Buddhist Counseling) | FNDM | ✓ | | ✓ | ✓ |
| C | භික්ෂුව හා සමකාලීන සමාජ විඥානය (Buddhist Monk and Contemporary Social Understanding) | FNDB | | ✓ | ✓ | ✓ |
| D | තාර්කික චින්තනය හා විද්‍යාත්මක ක්‍රමවේදය (Logic & Scientific Method) | FNDL | | ✓ | ✓ | ✓ |

**7.4 අර්ඝ රහිත අනිවාර්ය පාඨමාලා (දෙවන හා තෙවන වර්ෂ සඳහා නියමිත)**

| | විෂය | විෂය සංකේතය |
|---|---|---|
| 01 | Foundation Course in Information Technology | FNDI |
| 02 | Compulsory English | COEN |

**7.5 අභ්‍යන්තර සිසුන් සඳහා වන සහතික පත්‍ර පාඨමාලා (අනිවාර්ය නැත)**

| | විෂය | විෂය සංකේතය |
|---|---|---|
| 01 | දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in Tamil Language) | CCTL |
| 02 | ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in Japanese Language ) | CCJL |
| 03 | චීන භාෂා සහතික පත්‍ර පාඨමාලාව (Certificate Course in Chinese Languages ) | CCCL |

## 8. අධ්‍යයන පාඨමාලා ක්‍රමවේදය

8.1 සමාසික පාඨමාලා ඒකක ක්‍රමය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට ඇතුළත්වන උපාධි අපේක්ෂක ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සඳහා 2012 අධ්‍යයන වර්ෂයේ සිට පාඨමාලා ඒකක ක්‍රමය (Course Unit System) ක්‍රියාත්මක වේ.

8.2 පාඨමාලා ඒකක ඇගයීමේ ක්‍රමය

පාඨමාලා ඒකකයක්

1. මධ්‍ය සමාසික පරීක්ෂණය (Mid Semester Examination)
2. පැවරුම් (Assignments)
3. සමාසිකාන්ත පරීක්ෂණය (End Semester Examination)

යන කොටස් තුනකින් සමන්විත වේ.

පාඨමාලා ඒකකයක් සම්පූර්ණ කිරීම සඳහා මෙම කොටස් තුනම (03) සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ. මෙම කොටස් තුනෙන් (03) එකකට හෝ පෙනී නොසිටියහොත් ඉදිරි අධ්‍යයන වර්ෂයේදී නැවත එම පාඨමාලා ඒකකය සඳහා පෙනී සිටිය යුතුය.

පාඨමාලා ඒකකයක් සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| | | |
|---|---|---|
| 01 | මධ්‍ය සමාසික පරීක්ෂණය (Mid Semester Examination) | 20% |
| 02 | පැවරුම් (Assignments) | 20% |
| 03 | සමාසිකාන්ත පරීක්ෂණය (End Semester Examination) | 60% |
| | මුළු ලකුණු | 100% |

**(ඇතැම් විෂයන්වල මෙම ලකුණු වර්ගීකරණය වෙනස් විය හැකිය.)**

උපාධි අපේක්ෂකයන් ප්‍රධාන උපාධි පාඨමාලාවට අමතරව පහත සඳහන් විෂයයන් තුනම (03) විශ්වවිද්‍යාල අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

01. අනිවාර්ය ඉංග්‍රීසි (Compulsory English)
02. තොරතුරු තාක්ෂණ පදනම් පාඨමාලා (Foundation Course in Information Technology)
03. ප්‍රායෝගික භාවනා වැඩමුළු සහභාගිත්වය (Participation in Meditation Retreats)

- ගෞරව උපාධි අපේක්ෂකයන් සිව්වන වර්ෂයේදී වචන 10,000 කට නොඅඩු ස්වාධීන පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය.

8.3 සමාසිකාන්ත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශිෂ්‍යයකු විසින් සපුරා තිබිය යුතු අවශ්‍යතා

1. අඛණ්ඩ ඇගයීම් සම්පූර්ණ කර තිබීම.
2. දේශන සහභාගිත්වය 80% ක් හෝ ඉන් ඉහළ අගයක් වීම.

## 9. විෂය නිර්දේශ පටිපාටිය

### 9.1 බෞද්ධ අධ්‍යයන පීඨය

#### 9.1.1 බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය

ප්‍රධාන විෂය පාඨමාලා

1. බෞද්ධ දර්ශනය
2. බෞද්ධ ශිෂ්ටාචාරය
3. පාලි

#### 9.1.2 ව්‍යවහාරික බෞද්ධ අධ්‍යයනාංශය

ප්‍රධාන විෂය පාඨමාලා

1. ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය

පදනම් පාඨමාලා

1. භික්ෂුව හා සමකාලීන සමාජ විඥානය
2. භාවනා හා බෞද්ධ උපදේශනය
3. Foundation Course in Information Technology 1-II

සහතිකපත්‍ර පාඨමාලා

1. ජන සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව

9.2 **භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය**

9.2.1 **භාෂා අධ්‍යයනාංශය**

ප්‍රධාන විෂය පාඨමාලා

1. සංස්කෘත
2. සිංහල
3. English

පදනම් පාඨමාලා

1. ලේඛන කුසලතා (සිංහල මාධ්‍ය සිසුන් සඳහා)
2. Writing Skills (ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් සඳහා)
3. Compulsory English (අර්ඝ රහිත පාඨමාලාවකි)

සහතිකපත්‍ර පාඨමාලා

1. ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව
2. දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව
3. චීන භාෂා සහතික පත්‍ර පාඨමාලාව

9.2.2 **සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය**

ප්‍රධාන විෂය පාඨමාලා

1. පුරාවිද්‍යාව
2. උරුම කළමනාකරණය
3. පුස්තකාල හා විඥාපන විද්‍යාව
4. මනෝවිද්‍යාව
5. දර්ශනය
6. ඉතිහාසය
7. සමාජවිද්‍යාව
8. උරුම කළමනාකරණය
9. අධ්‍යාපන විද්‍යාව

පදනම් පාඨමාලා

1. තාර්කික චින්තනය හා විද්‍යාත්මක ක්‍රමවේදය

**මෙම අධ්‍යයන අංශය මගින් බෞද්ධ අධ්‍යයනය පිළිබඳව අධ්‍යාපනවේදි (ගෞරව) උපාධි පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලැබේ.**

10. ප්‍රවේශය කල් ගැනීම

යම් පාඨමාලාවකට තෝරා ගනු ලැබූ අපේක්‍ෂකයෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීමට අපේක්‍ෂා කරන්නේ නම් ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු විශ්වවිද්‍යාලයේ අදාළ අධ්‍යයනාංශයේ නිර්දේශ මත විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලැබුවහොත් එම ඉල්ලීමට උපරිම වශයෙන් එක් අවුරුදු කාලයක් අවසර දිය හැකිය.

එසේම ප්‍රවේශය කල් ගැනීමට අපේක්ෂා කරන්නෙකු අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වීමට පෙර එම ඉල්ලීම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

11. පුරප්පාඩු පිරවීම

තෝරා ගනු ලැබූ, එහෙත් නියමිත කාලය තුළ දී ලියාපදිංචි නොවන අයදුම්කරුවන් නිසා ඇතිවන පුරප්පාඩු ප්‍රමුඛතා ලේඛනයට අනුව පුරවනු ලැබේ. පුරප්පාඩු පිරවීමෙන් පසුව ලියාපදිංචි වීම සඳහා නැවත කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

මහෝපාධ්‍යායයන් වහන්සේ.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර) - 2024/2025

අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

**ඉතා වැදගත් : මෙහි සඳහන් උපදෙස් හොඳින් කියවා බැලීමෙන් අනතුරුව තම අයදුම්පත සම්පූර්ණ කරන ලෙස සියලුම අයදුම්කරුවන්ට මෙයින් තරයේ උපදෙස් දෙනු ලැබේ.**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම ( සිංහලෙන්) :- උදා : බෙරගම සුමන හිමි
02. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :- BERAGAMA SUMANA THERO
03. උපන් දිනය :- සඳහන් කරන්න.
04. උපන් ස්ථානය :- අදාළ විස්තර සපයන්න.
05. උපන් දිස්ත්‍රික්කය හා පළාත :- අදාළ විස්තර සපයන්න.
06. 2025.05.14 දිනට වයස සඳහන් කරන්න.
07. පුරවැසිභාවය උපතින් ද? ලියාපදිංචියෙන් ද? යන්න සඳහන් කරන්න.
08. ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න.
09. ස්ථිර ලිපිනය සිංහලෙන් සඳහන් කරන්න.
10. ස්ථිර ලිපිනය ඉංග්‍රීසියෙන් සඳහන් කරන්න.
11. දුරකථන අංක (ස්ථාවර/ ජංගම) සඳහන් කරන්න.
12. පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.
13. ඔබ විශ්වවිද්‍යාලයට තෝරාගනු ලැබූ විට පදිංචිය වෙනස් වන්නේනම් එම ස්ථානයේ ලිපිනය සඳහන් කරන්න.
14. අදාළ තොරතුරු සපයන්න
    14.1 සාමණේර / උපසම්පදා රෙජිස්ටරයේ සඳහන් පරිදි ආචාර්යවරයාගේ නම සහ ලිපිනය සඳහන් කරන්න.
    14.2 සාමණේර / උපසම්පදා රෙජිස්ටරයේ සඳහන් ආචාර්යවරයාගේ දුරකථන අංක සඳහන් කරන්න.
15. අදාළ තොරතුරු සපයන්න
    15.1 සාමණේර / උපසම්පදා රෙජිස්ටරයේ සඳහන් පැවිදිකළ ආචාර්යවරයාගේ නම සහ ලිපිනය සඳහන් කරන්න.

15.2 සාමණේර / උපසම්පදා රෙජිස්ටරයේ සඳහන් පැවිදිකළ ආචාර්යවරයාගේ දුරකථන අංක සඳහන් කරන්න.

16. බෞද්ධ විහාර දේවාලගම් පණත යටතේ ඔබ ලියාපදිංචි වී ඇත්නම් ඒ බව ''ඔව්/නැත'' ලෙස සඳහන් කරන්න.
17. ඉහත 16 හි ලියාපදිංචි අංකය ලියන්න. සාමණේර / උපසම්පදා ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න.
18. අදාළ විස්තර සපයන්න.
    18.1 අදාළ විස්තර සපයන්න.
    18.2 අදාළ විස්තර සපයන්න.
    18.3 අදාළ විස්තර සපයන්න.
    18.4 අදාළ විස්තර සපයන්න.
19. අදාළ කොටු තුළ විස්තර සඳහන් කර ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.
    19.1 අ.පො.ස. උසස් පෙළ විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලැබූ ලකුණු සංඛ්‍යාව
    19.2 අ.පො.ස. උසස් පෙළ විභාගයට ඉදිරිපත් වූ පරිපාලන දිස්ත්‍රික්කය සඳහන් කරන්න.
20. පාඨමාලා පිළිබඳ විස්තර හා ප්‍රවේශ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 3.2.ii අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය ඉල්ලුම් කරන්නේ නම් ප්‍රාචීන මධ්‍යම විභාග ප්‍රතිඵල සටහන් කරන්න. සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.

21. ප්‍රාචීන ප්‍රාරම්භ විභාග ප්‍රතිඵල සටහන් කරන්න.

22. පාඨමාලා පිළිබඳ විස්තර හා ප්‍රවේශ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 3.2. iv අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය ඉල්ලුම් කරන්නේ නම් බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත යන විෂයයක් යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් (වසරක හෝ ඊට වැඩි) කාලයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇත්නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. සහතික කළ විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.

23. අ.පො.ස. (සාමාන්‍ය පෙළ)/මූලික පිරිවෙන් අවසාන විභාග ප්‍රතිඵල සටහන් කරන්න. සහතික කළ විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.

24 24 සඳහා විස්තර සටහන් කරන්න. ඔබ 2024 වර්ෂයට පෙර විභාගයට පෙනී නොසිටියේ නම් ''අදාළ නොවේ'' යනුවෙන් සටහන් කරන්න.

24.1, 24.2 සඳහා හේතු දක්වන්න.

25. අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

25.1, 25.2, 25.3, 25.4 නිවැරදි විස්තර සඳහන් කරන්න.

25.5 ලියාපදිංචිය අවලංගු කර ගත්තේ නම් එම ලිපියේ ඡායා පිටපතක් අමුණන්න.

26. අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.

26.1. විස්තර නිවැරදිව සටහන් කරන්න.

27. අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න

28. නිවැරදි තොරතුරු සපයන්න.

28.1, 28.2, 28.3, 28.4 නිවැරදි තොරතුරු සපයන්න.

29 නිවැරදි තොරතුරු සපයන්න.

30. නිවැරදි තොරතුරු සපයන්න.

30.1, 30.2, 30.3, 30.4, 30.5 නිවැරදි තොරතුරු සපයන්න.

31. මේ සමග එවනු ලබන පාඨමාලා පිළිබඳ විස්තර හා ප්‍රවේශ ප්‍රතිපත්ති අනුව සම්පූර්ණ කරන්න.

32. අයදුම්කරුවන් 32 අංකය යටතේ එන i, ii, iii, iv, v,vi,vii සියලු කරුණු කියවා තේරුම්ගෙන අත්සන තැබිය යුතුයි.

33. අදාළ පරිදි සම්පූර්ණ කරන්න.

33.1, 33.2, 33.3, 33.4, නිවැරදි තොරතුරු සපයන්න.

34. අදාළ පරිදි සම්පූර්ණ කරන්න.

i, ii, iii, iv නිවැරදි තොරතුරු සපයන්න.

## පොදු උපදෙස්

1. අයදුම්කරුවන්ගේ ප්‍රකාශය 32.i. සිට 32.vi. දක්වා වගන්ති හොඳින් කියවා බලා අවබෝධ කොටගෙන අත්සන සමග දිනය යෙදිය යුතුය. අත්සන සමග දිනය හෝ අත්සන හෝ දිනය හෝ නොමැතිව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව සියලුම අපේක්ෂකයින් දත යුතුය. එම නිසා අයදුම්පත තැපැල් කිරීමට පෙර හෝ භාර දීමට පෙර තම අත්සන සමග දිනය යොදා තිබේ ද යන්න නැවත පරීක්ෂා කර බලන ලෙස සියලු ම අපේක්ෂකයන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

2. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පාසලින් පෙනී සිටි අපේක්ෂකයින් තම අයදුම්පත විදුහල්පතිවරයා ලවා ද පිරිවෙන්වලින් පෙනී සිටි අපේක්ෂකයින් තම අයදුම්පත පරිවේණාධිපතීන් වහන්සේ ලවා ද සහතික කරවා ඉදිරිපත් කළ යුතුය.

3. පාඨමාලාව පිළිබඳ විස්තර හා ප්‍රවේශ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එන පරිදි එහි අංක 03 යටතේ 3.2.i, 3.2.ii, 3.2. iii, 3.3.iv හා 3.3.v අනු අංකවල කරුණු සනාථ කිරීමේදී විභාග සහතිකවල ඡායා පිටපතක්/ පිටපත් ඇමිණිය යුතුය.

4. පෞද්ගලික අයදුම්කරුවන් තම අත්සන මෙහි පහත අංක 13 හි සඳහන් අයෙකු ලවා සහතික කොට එවිය යුතුය.

5. අයදුම්පතෙහි අංක 01 සිට 34 දක්වා සඳහන් තොරතුරු සම්පූර්ණ කර එවනු නොලබන අපේක්ෂකයන්ගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න අයදුම්පත තැපැල් කිරීමට හෝ භාරදීමට හෝ පෙර නැවත පරීක්ෂා කර බලා තහවුරු කර ගන්නා ලෙස සියලුම අපේක්ෂකයින්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

6. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව සියලු අපේක්ෂකයින් දත යුතුය. 2025.05.14 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයදුම්පත් 2025.05.14 දින හෝ ඊදිනට පෙර ලැබෙන සේ එවන ලෙස සියලුම අයදුම්කරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

7. තෝරාගනු ලබන සුදුසුකම් සපුරාලන ශිෂ්‍යයන්හට මහපොළ හෝ ශිෂ්‍යාධාර ලබාදෙනු ඇත. මහපොළ/ ශිෂ්‍යාධාර පිළිබඳ වැඩි විස්තර සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) ගෙන් විමසා දැනගත හැකිය. මහපොළ/ශිෂ්‍යාධාර ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරාලිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පනවා තිබෙන නීති රීතිවලට යටත් විය යුතුය.

8. ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) ගෙන් විමසා ලබා ගත හැක.

9. උසස් අධ්‍යාපන ආයතන දෙකක ලියාපදිංචි වී සිටින අපේක්ෂකයින් : ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල ප්‍රවේශය අයදුම් කරනු ලබන අපේක්ෂකයින් අයදුම්පත් එවනු ලබන අවස්ථාව වන විට වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලයක / ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ / අධ්‍යාපන විද්‍යා පීඨයක ලියාපදිංචි වී සිටින බව අනාවරණය වුවහොත් ඔහුගේ ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු කරනු ලබන බව ද ශිෂ්‍ය ලියාපදිංචිය අවලංගු වීමත් සමග ඊට අදාළ සියලු වරප්‍රසාද අහිමි වන බව ද, සියලුම අයදුම්කරුවන් දත යුතුය.

10. අයදුම්පත නිසිලෙස සම්පූර්ණ කර 2025.05.14 දිනට හෝ ඊදිනට පෙර ලැබෙන සේ මෙහි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශ්වවිද්‍යාල ප්‍රවේශය (අභ්‍යන්තර) - 2024/2025"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා),**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුරය.**

11. අපේක්ෂකයින් ලියාපදිංචි කරගනු ලබන්නේ ඔවුන්ගේ **අධ්‍යාපන සහතික පත්** පරීක්ෂා කිරීමෙන් පසු ව බැවින් අයදුම්පතෙහි සඳහන් සහතික පත්වල **මුල් පිටපත්** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ට දන්වා යැවූ විට එම සහතික විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම **අනිවාර්ය** බව සලකන්න. ඉන් පසුව ලියාපදිංචි ගාස්තු ගෙවීම පිළිබඳ දන්වා එවනු ලැබේ.

12. අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත් සමග අමුණා එවිය යුතුය.

13. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම.

සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් කවරෙකු හෝ ලවා තම අත්සන සහතික කරවා ගත යුතුය. පරිවෙණාධිපතීන් වහන්සේ නමක්, විහාරාධිපතීන් වහන්සේ නමක්, විදුහල්පතිවරයෙක්, ග්‍රාමසේවා නිලධාරියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක් හෝ වසරකට රු.86,700/-කට නොඅඩු වැටුපක් ලබන රජයේ, පළාත්පාලන හෝ රාජ්‍ය සංස්ථා සේවාවක මාණ්ඩලික නිලධාරියෙක්.

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුරය.

**අංක 33.2 හා 33.3 ට අදාළ පරිපාලන දිස්ත්‍රික්ක සහ ඒවාට අදාළ අංක පහත දැක්වේ.**

ඔබ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලිය යුත්තේ කිනම් දිස්ත්‍රික්කයකින් ද ?

| **පරිපාලන දිස්ත්‍රික්කය** | **අංකය** |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| කිලිනොච්චි | 11 |
| මන්නාරම | 12 |
| මුලතිව් | 13 |
| වව්නියාව | 14 |
| ත්‍රිකුණාමලය | 15 |
| මඩකලපුව | 16 |
| අම්පාර | 17 |
| පුත්තලම | 18 |
| කුරුණෑගල | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| කෑගල්ල | 24 |
| රත්නපුර | 25 |

ඒ අනුව අයදුම්කරු සලකා බැලිය යුතු දිස්ත්‍රික්කයට අදාළ අංකය දී ඇති කොටුවේ සඳහන් කරන්න.

උදා : ප්‍රවේශ නීතිරීති අනුව අයදුම්කරු සලකා බැලිය යුත්තේ ***<u>ගම්පහ දිස්ත්‍රික්කයෙන්</u>*** නම් | 0 | 2 |